**මීගමුව මහා නගර සභාව**

**----------------------------**

**ගම්පහ දිස්ත්‍රික්කය**

**---------------------**

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 08 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූලි 27 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අගෝස්තු 30 දිනද සභාවට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මීගමුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | පුස්තකාලය ඉදිකිරීමේදී වැඩබිමේ ද්‍රව්‍ය සඳහා කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවා තිබූ රු.9,723,914 ක් කර්මාන්ත ණයහිමි ගිණුමට හර කළ යුතු වුවත් එම ගිණුමට රු. 4,012,000 ක් පමණක් ගිණුම්ගත කර ඉතිරි රු.5,711,914 ක මුදල පරිපූරක අයවැයක් මඟින් පුස්තකාල ගොඩනැගිලි ඉදිකිරීම (දේශීය ණය සංවර්ධන අරමුදල) යටතේ සටහන් කර තිබුණේ ඒවන විටත් ණයහිමි ගිණුමේ තිබූ හර ශේෂය අඩුකර දැක්වීමට විය. | මූල්‍යප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් කර නිවැරදි කිරීම් කළ යුතුවේ. | පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැඩබිම් ද්‍රව්‍ය සඳහා ගෙවීම්කිරීමට 2018 අයවැය ලේඛනයේ හෝ ණය හිමියන් යටතේ ප්‍රතිපාදන වෙන් කර නොතිබූ බැවින් මෙම දෝෂය සිදුව ඇත. දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ඉදිරි බිල්පත් සඳහා මුදල් ලැබීමේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) | මඤ්ඤොක්කාහේන පොදු සුසාන භූමියේ නව ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා ගෙවීම් කිරීමේදී රු.660,877 | කොන්ත්‍රාත් සඳහා ගෙවන ලද වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම මත වැට් ගෙවිය | ගිණුම් තැබීම නිවැරදිය. අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත්කරුට ගෙවා ඇති මුදල රු.4,405,865ක් වන අතර |

| | | | |
|---|---|---|---|
| | කපෙර ගෙවුම් මුදල අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නොහැක. | රු.660,877ක මුදල එ.අ.ම.(VAT)බදු මුදලවේ. |
| (iii) | 2016 දී ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනය වෙත ගෙවා තිබූ රු.892,500 ක අත්තිකාරම් මුදල 2017 මැයි 19 වන දින අයකරගෙන තිබුණද එම මුදල පෙර ගෙවුම් ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්වලින්ඉවත් කිරීමට කටයුතු කළ යුතුවේ. | ලේඛනය නිවැරදි කර ඇත. |
| (iv) | 2013 වර්ෂයේදී නව බස් නැවතුම්පල ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුවේ අවසන් ගෙවීම ලෙස පෞද්ගලික කොන්ත්‍රාත් ආයතනයකටරු.16,198,530ක් ගෙවිය යුතු වුවද ණයහිමියන් ලෙස 2018 වර්ෂයේ වෙන් කිරීම් කර තිබුණේ රු.5,000,000 ක් පමණි. අවසාන ගෙවීම නොකිරීම සම්බන්ධයෙන් සභාවට එරෙහිව කොන්ත්‍රාත්කරු විසින් නඩු පවරා තිබුණද ගිණුම් මඟින් හෙළිදරව් කිරීමක් කර නොතිබුණි. | ණයහිමියන්සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ගත යුතු අතර ගිණුම්කරන ප්‍රතිපත්ති වලට අනුව අසම්භාව්‍ය බැරකම් ගිණුම්වල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 මූල්‍ය ප්‍රකාශනවල සටහන් මඟින් සභාවට එරෙහිව පනවා ඇති නඩු සම්බන්ධව හෙළිදරව් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (v) | සභා අරමුදල් මඟින් නිම කිරීමට ගිවිසුම්ගත වූරු.16,142,173 ක් වූ කර්මාන්ත 20 ක වටිනාකම සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ගිවිසුම්ගත වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් ණයහිමි ප්‍රතිපාදන සලසාගත යුතුවේ. | ප්‍රදේශ වාසීන්ගේ ගැටලු මතද ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කර නොමැත. සභාවේ පවතින මූල්‍ය තත්ත්වය මත නගරාධිපතිතුමාගේ උපදෙස් පරිදි සමහර ව්‍යාපෘතිප්‍රමුඛතාවයදීඉටු කරන ලද අතරව්‍යාපෘති කිහිපයක් පමණක් අවලංගු කිරීමට කටයුතු කර ඇත. |
| (vi) | හැමිල්ටන් ඇල බෝට්ටු සේවාවන් පවත්වා ගැනීමට අදාලව සමාලෝචිත වර්ෂයේ බදු ආදායම රු.484,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | මූල්‍යප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් කර නිවැරදි කිරීම් කළ යුතුවේ. | මෙය 2017 වර්ෂයේ බදු ආදායමක් වන අතර එය ප්‍රමාද දෝෂයකින් එම වර්ෂයට ගිණුම්ගත කර නොමැත. ඉදිරියේදී මෙවැනි දෝෂ ඇති නොවීමට නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. |
| (vii) | අය කර තිබූ උසාවි දඩ ආදායමින් රු.1,347,500 ක් ණය පදනම මත ලබා ගත් ට්‍රැක්ටර් සහ ටේලර් සඳහා | වර්ෂයට අදාල ආදායම් ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වසරේ ජර්නල් සටහන් අංක 02මඟින් නිවැරදි කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | ණය වාරික වශයෙන් හිලව් කර තිබුණද උසාවි දඩ ආදායමට රු.800,000 ක් බැර කර තිබීමෙන් උසාවි දඩ ආදායම රු.547,500 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | | |
| (viii) | මුද්දර ගාස්තු ආදායමින් රු.2,784,000 ක වටිනාකමක් ණය පදනම මත ලබාදී තිබූ කම්පැක්ටර් රථවල ණය වාරික වශයෙන් හිලව් කර තිබුණදරු.1,984,000 ක් මුද්දර ගාස්තු ආදායමට බැර කර තිබීමෙන් මුද්දර ගාස්තු ආදායම රු.800,000 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | වර්ෂය තුළ ලද මුද්දර ආදායම ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වසරේ ජර්නල් සටහන් මගින් නිවැරදි කර ඇත. |
| (ix) | පළාත් පාලන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත) වෙතින් ණය පදනම මත ලබාදුන් රු.7,186,000 ක් වටිනා ට්‍රැක්ටර් හා ටේලර් රථ 04ක් හාරු.29,384,000 ක් වටිනා කම්පැක්ටර් රථ 02 ක්ගිණුම්ගත කිරීමේදී අයකරගත හැකි උපයෝගී සේවා ගිණුම හර කර පළාත් පාලන දෙපාර්තමේන්තු ණය ගිණුම බැර කල යුතු වුවත් ණය ගිණුම බැර කර සමුච්චිත අරමුදල් ගිණුමට හර කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් කර නිවැරදි කිරීම් කළ යුතුවේ | 2018 වසර තුළ වාහන මිලදී ගැනීම සඳහා අය වැය ලේඛනයේ ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර නොතිබූ බැවින් සමුච්චිත අරමුදලට හර කර සටහන් තබා ඇත. |
| (x) | සමාලෝචිත වර්ෂය තුළදී ඉහත වාහන වෙනුවෙන් වාරික වශයෙන් රු.4,697,000ක් ගෙවා තිබුණද පළාත් පාලන දෙපාර්තමේන්තු ණය ගිණුමට රු.2,784,000ක් පමණක් ගලපා තිබීම හේතුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තු ණය ගිණුම රු.1,895,000ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | ණය වාරික ණය ගිණුමටගැලපිය යුතුවේ. | 2019 වසරේ මෙම වරද නිවැරදි කර ඇත. |
| (xi) | ණය පදනම මත ලබා ගත් ට්‍රැක්ටර් හා ට්‍රේලර් රථ 04 ක් හාකම්පැක්ටර් රථ 02 ක් සඳහා ගෙවන ලද රු.4,697,000 ක් වුවාරික මුදල් ප්‍රාග්ධනිත නොකර ට්‍රැක්ටර් හා ට්‍රේලර් රථ 04 හි මුළු වටිනාකමවූ | මේ සඳහා පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් තැබිය යුතුවේ. | 2018 වර්ෂය තුළ ගබඩාවෙන් නිකුත්කර නොමැති නිසා ප්‍රාග්ධනිත නොකළබව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| | රු.7,186,000 ක් තොග ගිණුමට හා කම්පැක්ටර් රථ 02 හි වටිනාකම රු.29,384,000 ක් මෝටර් රථ හා කරත්ත ගිණුමට ගලපා තිබුණි. | | |
| (xii) | සමාලෝචිත වර්ෂයේ කපාහරින ලද පසුගියවර්ෂවලටඅදාළ රු.8,307,596 ක් වූ හිඟ වරිපනම් වර්ෂයේ ආදායමින් කපා හැර තිබුණි. | පසුගිය වර්ෂවලට අදාල හිඟ කපාහැරීම් සමුච්චිත අරමුදලට ගැලපිය යුතුය. | පිළිතුරු ලබාදී නොමැත. |

(ආ) නොසැසඳුණු ගිණුම්
-------------------------

| | විගණන නිරීක්ෂණය<br>----------------------- | නිර්දේශය<br>---------- | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>--------------------------- |
|---|---|---|---|
| (i) | 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 12 ක ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 94,390,140 කවෙනසක් විය. | අදාල වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | තවදුරටත් පරීක්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කරමි. |
| (ii) | 2018 දෙසැම්බර් 31 දිනට විවිධ තැන්පත් ගිණුමේ ශේෂය රු.23,168,509 ක්ද, උපලේඛනයේ ශේෂය රු.23,122,212 ක් හා තැන්පත් ලේඛනයේ ශේෂය රු.21,467,109 ක් විය. | ගිණුම, උපලේඛන හා ලේඛනය සමාන විය යුතුවේ. | නිරවුල් කිරීමට කටයුතු කර ගෙන යමින් පවතී. |
| (iii) | 2018 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ගිණුම හා වරිපනම් පරිගණක පද්ධතිය අතර රු.20,717,463 ක වෙනසක් විය. | නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හඳුනා ගන්නා ලද ගැටලු නිවැරදි කරමින් සිටින අතරඉදිරියේදී නිවැරදි කිරීමට හැකිවනු ඇත. |

(ඇ) ලැබිය යුතු ගිණුම්
-------------------

| විගණන නිරීක්ෂණය<br>---------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>---------------------- |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට පෙර ගෙවුම් ශේෂය රු.31,195,884 ක් වූ අතරඒ තුළ ගබඩා | නිලධාරින්ට ගෙවන ලද පෙරගෙවුම් අදාල කාර්ය නිමවූ විගස පියවීමට කටයුතු කළයුතු | දීර්ග කාලයක් තිස්සේ පැවත එමින් පවතින හඳුනා ගත නොහැකි පෙර ගෙවුම් |

| | | |
|---|---|---|
| ණයගැතියන්ගෙන් අයවිය යුතු වසර 1 සිට 22 දක්වා කාල පරාසයකවූ රු.8,004,702 ක්, විවිධ ණයගැතියන්ගෙන් අයවිය යුතු වසර 1 සිට 37 දක්වා කාල පරාසයක වූ රු.1,711,085 ක් වූ අතර එම මුදල් අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි. | අතර ලබාදුන් පෙරගෙවුම් පියවීම් කිරීමට පෙර විට නැවත පෙරගෙවුම් ලබා දීම නොකළ යුතුවේ. | අයිතමයන් ඇති අතර ඒවා නිරවුල් කිරීමේ ගැටළුවක් පවතින අතර තව දුරටත් මේ සම්බන්ධව සොයා බලා හඳුනාගෙන ඇති පෙරගෙවුම් පියවීමට කටයුතු කරමින් පවතී. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.538,198,068 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාලව උපලේඛන,කාල විශ්ලේෂණ හා සමීක්ෂණ මණ්ඩල වාර්තා යනාදි සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ශේෂ සනාථ කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | පිළිතුරු දී නොමැත. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | - | රු. | | | |
| (අ) | මහා නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 254(අ) | - | 2014 වර්ෂයේ සිට 2017 දක්වා කාලය තුළ කොච්චිකඩේ උප කාර්යාලයේ රු.1,900,869 ක් වූ හිඟ වෙළඳ බලපත්‍ර ශේෂය අයකර ගැනීමටසභාව විසින් කටයුතු කර නොතිබුණි. | හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගතයුතුවේ. | හිඟ බලපත්‍ර ගාස්තු අය කිරීමට කටයුතු යොදා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ xxiv හා xxv වගන්ති | - | පිටතින් මස් ප්‍රවාහනය කිරීම සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් බලපත්‍රයක් නිකුත් කිරීම, ඒ සඳහා යොදවන කාර්ය මණ්ඩලයසභාවේ ලියාපදිංචි කිරීම හා එම මස් මනුෂ්‍ය ආහාරයට සුදුසු බවට පරීක්ෂා කර දීම වෙනුවෙන් ගාස්තු පනවා ගැනීම සිදු කර නොතිබුණි. | පළාත් පාලන පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | 2019 මාර්තු 21 දින සිට මස් පරීක්ෂාව වෙනුවෙන් මුදල් අයකිරීමට පෙරත්, මීගමුව නාගරික බල ප්‍රදේශයේ සියලුම ගවමස් වෙළදසැල් හිමියන්ගෙන්වාර්ෂික ව සාතනාගාර ගාස්තුවක් අයකරන ලදී. |
| (ඇ) | ශ්‍රී ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 189 | 1,104,572 | 2018 දෙසැම්බර් 31 දිනට රු.1,104,572 ක් වටිනා වසර 1 සිට 26 දක්වා කාල පරාසයක අගරු චෙක්පත් 59 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුවේ. | අගරු චෙක්පත් දීර්ඝ කාලයක සිට පැවත එන අතර ඒ පිළිබඳව සොයා බැලූ නමුත්, තොරතුරු සොයාගත නොහැක. සොයා ගත් තොරතුරු අනුව කොටසක් පමණක් නිරවුල් කරන ලදි. |
| (ඈ) | පලාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ | | | | |
| (i) | 2016 නොවැම්බර් 09 දිනැති අංක LGD/13/2016 දරන චක්‍රලේඛයේ අංක 3, 13 හා අංක 15 ඡේද | - | මීගමුව මහා නගර සභාවට අයත් කඩ කාමර 116 ක් 2003වර්ෂයේ සිට තාවකාලික පදනම මත වෙන්කර දී තිබූ නමුත් මෙම ස්ථාන මේ වන විට ස්ථිර පදනමකින් පවත්වාගෙන යමින් පැවතුණි. | චක්‍රලේඛවිධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙමස්ථානයේ පවතින කඩකාමර සභාවවිසින් ඉදිකරන ලද හෝ පැවති කඩකාමර නොවන අතර, දැනට වසර 16 කට පමණ පෙර, මාර්ගවල පදික වෙළඳාමේ නිරතව සිටි පිරිස එක් ස්ථානයකට ඒකරාශී කිරීම සිදුකර ඇත. |
| | | - | බදු ගිවිසුමකට යටත් වන අවස්ථාවේදී පැවරුමක් සිදුවන්නේ නම් පැවරුම් | චක්‍රලේඛවිධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මෙම කඩකුටි වලින් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ |

| | | | | |
|---|---|---|---|---|
| | | ගාස්තුව මාසික බදු කුලිය මෙන් 60 ගුණයකට නොඅඩු වටිනාකමක් වියයුතු වුවත් මෙම කඩ කාමර 116 න් විශාල ප්‍රමාණයක් මේ වන විට අතින් අත හුවමාරු වී ඇති අතර පැවරුම් ගාස්තු විශාල ප්‍රමාණයක් සභාවට අහිමිවී තිබුණි. | | ශේෂයෙන් තව දුරටත් අයවිය යුතුව ඇති මුදල රු.19,775ක්පමණි. |
| (ii) 1988 අප්‍රේල් 20 දිනැති අංක 88/20දරන චක්‍රලේඛය | - | හිඟ අදායම් කුමන වකවානුවලට අයත්දැයි දැක්වෙන ප්‍රකාශයක් සකස් කර යටත් පිරිසෙන් තුන් මසකට වරක්වත් සභාවට ඉදිරිපත් කිරීමට සලස්වා නොතිබුණි. | හිඟ ආදායම් දැක්වෙනප්‍රකාශය න් සකස් කර සභාවටඉදිරිපත් කළ යුතුවේ. | හිඟ ආදායම් වාර්තා මාසිකව සභාවට යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. |

1.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තලාහේන උප කාර්යාලයට අයත් රු.186,015ක් වූ වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු හිඟ ශේෂයක් අනුමැතියකින් තොරව ලේඛනවලින් ඉවත්කර තිබුණි. | හිඟ කපා හැරීම සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතුවේ. | මෙම පැරණි හිඟ ශේෂය පිළිබඳ ලිපි ගොනුවක් විවෘත කර ඇති අතර ඉදිරියේදී ඒ පිළිබඳව සොයා බලා නිරවුල් කිරිමට කටයුතු කරමි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.276,774,291 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.173,281,595 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018<br>ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017<br>ඇස්තමේන් තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. |
| (i) | වරිපනම් හා බදු | 147,458 | 169,807 | 169,484 | 109,892 | 149,069 | 163,911 | 151,189 | 106,455 |
| (ii) | කුලී | 39,640 | 37,378 | 34,859 | 19,867 | 26,427 | 34,959 | 33,671 | 17,276 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 59,063 | 62,890 | 61,345 | 5,418 | 45,384 | 67,431 | 67,431 | 3,879 |
| (iv) | වෙනත් ආදායම් | 288,638 | 440,246 | 335,652 | 109,257 | 259,679 | 221 | 221,196 | 7,155 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ අවසානයට තිබූ හිඟ වරිපනම්, කුලී හා බලපත්‍ර ගාස්තු, සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.3,437,000 ක්,රු.2,591,000 ක් හා රු.1,539,000 කින් වැඩිවී තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියා මාර්ග අනුගමනය කළ යුතුවේ. | තක්සේරු නොවූ දේපල හඳුනාගෙන තක්සේරු කිරීමට කටයුතු කරමි. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කොච්චිකඩේ උප කාර්යාලයට අයත් ඒත්තුකාල ප්‍රදේශයේ හෝටලයක් හා ඇඟලුම් කර්මාන්ත ශාලාවකට අදාල රු.2,244,814 ක හිඟ වරිපනම් සභා අනුමැතියක් නොමැතිව කපා හැර තිබුණි. | හිඟ වරිපනම් කපා හැරීම සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුවේ. | සියලුම දේපල සඳහා බදු සහන ලබා දී ඇත. |

2.2.4 කුලී

| | | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | (i) | 2014 වර්ෂයේ සිට මුද්‍රා තබා වසා තිබූ කොච්චිකඩේ මධ්‍යම වෙළඳපලෙහිවූ කඩ කාමර 02 ක් සඳහා 2018 දෙසැම්බර් 31 දිනට රු.247,886 ක මුදලක් අය කර ගෙන නොතිබුණි. | හිඟ කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු පසුව ඉදිරිපත් කරමි. |
| | (ii) | සභාවට අයත් කඩ කාමර 325 කින් 2018 දෙසැම්බර් 31 දිනට රු.12,407,216ක හිඟයක් සහ 2012 වර්ෂයේ සිට පැවත එනමීගමුව ප්‍රදේශයේ මස් කඩවලින් රු.105,758 ක හිඟයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | පිළිතුරු පසුව ඉදිරිපත් කරමි. |
| (ආ) | (i) | නව තානායම බදු දීමට අදාලව නාගරික සංවර්ධන අධිකාරිය සමඟ ඇති කර ගෙන තිබූ ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව තානායමෙන් වසර 20 ක කාල සීමාව තුළ සෑම වර්ෂ 05 කට වරක්ම මාසික ගාස්තුව සියයට 25 කින් වැඩි කිරීමට එකඟවී තිබුණද,2003 වර්ෂයේ අය කර තිබූ මාසික ගාස්තුව වර්ෂ 15කින් සංශෝධනය කිරීමට පියවර ගෙන නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව තානායම් කුලී සංශෝධනය කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නැත. |
| | (ii) | කඩ බදු දීම්වලට අදාල යතුරු කාසි හා ටෙන්ඩර් මුදල්වල 2018 වර්ෂයේ ආරම්භක හිඟය රු.18,748,049 ක් වූ අතර ඉන් රු.9,665,116 ක් අයකරගෙන නොතිබුණි. මෙම හිඟ සඳහා 2008 වසරේ සිට වසර 10 ක් ගතවී ඇතත් මෙතෙක් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ අයකර ගැනීම සඳහා නීතිමය පියවරගත යුතුවේ. | බදු නොගෙවූ කඩ මුද්‍රා තබා සභාවට පවරා ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2018 දෙසැම්බර් 31 දිනට වූ රු.1,982,546 ක අය විය යුතු සතිපොළ ගාස්තු ආදායමින්, රු.523,586 ක් 2012 වර්ෂයට පෙර කාල සීමාවක සිට පැවත එන ශේෂයක් වූ අතර 2019 ජූනි 30 දින වන විට මුළු හිඟයෙන් රු.736,322 ක් අයකර නොතිබුණි. | හිඟ අයකර ගැනීම සඳහා විධිමත් පියවර යුතුවේ. | හිඟයෙන් යම් ප්‍රමාණයක් මේ වන විට අයකර ගෙන ඇත. |
| (iv) | බදුදී තිබූ වැසිකිළි පද්ධති 03 කින් හා විජයපාල මෙන්ඩිස් ක්‍රීඩාංගණය අසළ කිරිහලකින් එකතුව රු.81,642 ක හිඟයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බදුදේපල වලට අදාලව හිඟ ආදායම් රැස්කර ගැනීමට විධිමත්ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ටෙන්ඩර්කරුට එරෙහිව නඩු පවරා ඇත. |

2.2.5 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කොච්චිකඩේ උප කාර්යාල බල ප්‍රදේශයේ පිහිටි හෝටල් 46 කින් හා මීගමුව බල ප්‍රදේශයේ පිහිටි හොටල් 25 කින් බලපත්‍ර ගාස්තුසහ නාගරික සීමාව තුළ පවත්වාගෙන යන ලී මෝල් 02 කින් සමාලෝචිත වර්ෂය සඳහා පරිසර බලපත්‍ර ආදායම් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | බලපත්‍ර නොමැතිව ව්‍යාපාර කටයුතු කිරීමට ඉඩදිය නොහැකි අතර ඒ සඳහා නීතිමය කටයුතු සිදුකළ යුතුවේ. | පිළිතුරු පසුව ඉදිරිපත් කරමි. |

2.2.6 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **කුළුණු ආදායම** | | |
| සන්නිවේදන කුළුණු 45 ක් සඳහා වරිපනම් අයකර නොතිබුණි. | සන්නිවේදන කුළුණු සඳහා තක්සේරුකිරීම් සිදුකර වරිපනම් ආදායම් රැස්කර ගැනීම සිදුකළ යුතුය. | කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගනිමි. |

(ආ) **මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| ගම්පහ හා කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් 2016 දෙසැම්බර් සිට 2018 වර්ෂය දක්වා අයවිය යුතු මුද්දර ගාස්තු ආදායම් 2019 මැයි 31 දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුද්දර ගාස්තු අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුවේ. | අයකර ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. |

(ඇ) **සංචාරක බෝට්ටු සේවයේ ආදායම**

| | | |
|---|---|---|
| හැමිල්ටන් ඇල ජැටියෙහි සංචාරක බෝට්ටු සේවයක් පවත්වාගෙන යාමට පෞද්ගලික ආයතනයක් සමඟ ටෙන්ඩර් කැඳවීමකින් තොරව 2017 - 2022 දක්වාවූ වර්ෂ 05 ක කාලයක් සඳහා මාසිකව රු.55,000 ක මුදලකට ගිවිසුම් ගතවී තිබූ අතර සංචාරක කර්මාන්තය දියුණු කිරීමේ අභිලාශයෙන් හා පරිසර හිතකාමීව පවත්වාගෙන යාම සඳහා ගිවිසුමට ඇතුලත් කර තිබූ කොන්දේසි අංක 07 හා 08 අනුව කටයුතු කර නොතිබුණි. | දේපල බදුදීමේදී විධිමත් අනුමැතියක් යටතේ නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කළ යුතුවේ. | බදු ගිවිසුම අවලංගුකර නව ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීමට නියමිතය. |

2.2.7 අධිභාර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව ඉකුත් වර්ෂයන්වල පැනවූ අධිභාර 04 ක් සඳහා 2018 දෙසැම්බර් 31 දිනට රු.2,407,613 ක මුදලක් අය කර ගැනීමට තිබුණි. | අධිභාර අය කිරීම හා නිදහස් කිරීම පිළිබඳ විස්තර විගණනය වෙත වාර්තා කළ යුතුවේ. | එක් අධිභාරයක් සඳහා නඩුවක් අභියාචනා අධිකරණයේ විභාගවෙමින් පවතින අතර තවත් අධිභාරයක් සඳහා කොටස් වශයෙන් මුදල් ගෙවමින් පවතී. පළාත් විෂය භාර අමාත්‍යවරයා විසින් තවත් අධිභාර 02 ක් නිදහස් කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛවිහරණ පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධන වාර්තාව විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | වර්ෂයට අදාල ඉලක්ක කළ කාර්යයන් සම්බන්ධයෙන් කාර්යසාධන වාර්තාවක් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත. |

#### (ආ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | 2018 දෙසැම්බර් 31 දිනට සභා අරමුදල් මගින් වටිනාකම රු.16,142,173 ක් වූ කර්මාන්ත 20 ක් නිමකිරීමට ගිවිසුම් ගතවී තිබුණද 2019 ජුනි 15 දින වන විටත් එම කර්මාන්ත නිමකර නොතිබුණි. | ගිවිසුම්ගත ව්‍යාපෘති කඩිනමින් නිම කරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රදේශ වාසීන්ගේ ගැටලු මත සමහර ව්‍යාපෘති ක්‍රියාත්මක නොකරන ලදී. ප්‍රමුඛතාවය දියයුතු ව්‍යාපෘති පමණක් ක්‍රියාත්මක කරන ලදී. ණයහිමි ලේඛනයට ඇතුලත් නොකළ ව්‍යාපෘති අවලංගු කිරීමට කටයුතු කර ඇත. |
| (ii) | තක්කියා පාරේ පෝරුතොට සිට එන වම්පස කාණුව සහ පාර දෙපස ප්‍රතිසංස්කරණය කිරීම සඳහාරු.1,292,605 කට ගිවිසුම් ගතවී තිබුණද ගිවිසුම් ප්‍රකාරව අදාල ව්‍යාපෘතිය සම්පූර්ණ කර නොතිබූ අතර රු.317,563 ක් ගෙවා කාණුව ප්‍රතිසංස්කරණය කිරීමේ කාර්යය අත් හැර තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතිය අවසන් කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නැත. |

(ඇ) **සන අපද්‍රව්‍ය කළමනාකරණය**

**-----------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------- | -------------------- |
| මහා නගර සභාවේ බසාර් II කොට්ටාශය හා තලාහේන ප්‍රදේශයේ කසල බැහැර කිරීම සඳහා 2015 ජූලි 01 දින සිට 2018 ජුනි 30 දක්වා වසර තුනක කාල පරිච්ඡේදයක් සඳහා මසකට රු.2,196,000 ක් ගෙවීම් කිරීමේ පදනම මත පෞද්ගලික සමාගමක් සමග ගිවිසුමකට එළඹ තිබුණි. ඒ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) සමාගම විසින් එකතු කරන කසල නගර සීමාවෙන් පිටත පෞද්ගලික ඉඩමකට බැහැර කිරීම ගිවිසුම් ප්‍රකාරව සිදුකර තිබුණු අතර ගම්වාසීන්ගේ විරෝධතාවය මත 2018 අප්‍රේල් සිට මහා නගර සභා සීමාවේ කොච්චිකඩේ ප්‍රදේශයේ කසළ අංගනයට බැහැර කිරීම සිදුකර තිබුණි. | ගිවිසුම් සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුවේ. | ඇතැම් අවස්ථාවල කොච්චිකඩේ ඕවිටියාවත්ත කසල අංගනයට කසල බැහැර කරන ලදී. |
| (ii) මහා නගර සභාවේ ස්ථානයකටම කසළ බැහැර කිරීම නිසා ගිවිසුම පරිදි මුදල් ගෙවීමක් සිදු නොකළ යුතු බැවින් ඒ සඳහා මසකට රු.130,000 - රු. 155,000 මුදලක් අය කර ගැනීමට ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක මුදල් කාරක සභාවට නිර්දේශ කර තිබුණද මසකට රු.50,000 බැගින් අඩු කර තිබුණි. | ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් මුදල් කාරක සභාවට කළ නිර්දේශ පිළිබඳ අවධානය යොමු කළ යුතුවේ. | විරෝධතා මැද පිට පළාතකට කසල බැහැර කළ නොහැකි බැවින් සභාවේ ප්‍රදේශයකට කසල බැහැර කිරීම වෙනුවෙන් සාධාරණ ගාස්තුවක් අයකර ඇත. |
| (iii) මේ හේතුවෙන් කොන්ත්‍රාත්කරුට ඉතිරි වන ඉන්ධන, කාලය පිළිබඳව සැලකිලිමත් වී නොතිබූ අතර කසල පස් යොදා වැසීම සභාව විසින් සිදු කිරීම හේතුවෙන් අමතර පිරිවැයක්ද දැරීමට සිදුව තිබුණි. | සභාවේකසල අංගනයට කසල බැහැර කිරීමට අවසර දීමට පෙර ඒ සඳහා දැරීමට සිදුවන පිරිවැය සැලකිල්ලට ගනිමින් ප්‍රමාණවත් ගාස්තුවක් අයකිරීමට සභාව කටයුතු කළ යුතුවේ. | සේවා ගිවිසුම අනුව අදාල ආයතනය කසල පිවිසුම් අංගනය නඩත්තු කළ අතර සභාව විසින් අමතර ගාස්තුවක් නොගෙවන ලදී. |

(ඇ) **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරී නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය අනුව 2015-2030 කාලය තුළ ළඟා කර ගතයුතු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගෙන ඒවා ක්‍රියාත්මක කිරීම,එම අරමුණු හා ඉලක්ක මැනීම හා නියාමනය කිරීම සඳහා දර්ශක හඳුනා ගැනීම, පාදක දත්ත හඳුනා ගැනීම සඳහාඑහි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම කර නොතිබුණි. | එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයඅනුව සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. | තිරසාර සංවර්ධන ඉලක්ක පාදක කර ගනිමින් සභාවේ සිව් අවුරුදු සැලසුම් සහ වාර්ෂික සැලසුම් සංශෝධනය කරමින් පවතින අතර, ඉදිරියේදී විගණනයට ලබා දීමට කටයුතු කරමි. |

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරී නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2018 වර්ෂය සඳහා මීගමුව බල ප්‍රදේශයට සම්පූර්ණ නඩත්තු ඇස්තමේන්තු 42 ක් පිළියෙල කර තිබූ අතර ඇතුළත් කර තිබූ ද්‍රව්‍ය පිරිවැය රු.5,937,855 ක් විය. එසේ වුවද නඩත්තු කටයුතු සඳහා රු.38,074,599 ක ද්‍රව්‍ය නිකුත් කර තිබූ අතර ඇස්තමේන්තුවෙන් බැහැරව රු.32,136,744 ක ද්‍රව්‍ය නිකුත් කර තිබුණි. | ඇස්තමේන්තු කිරීමකින් තොරව ද්‍රව්‍ය නිකුත්නොකළ යුතුවේ. | ද්‍රව්‍ය නිකුත් කිරීම් සඳහා ඇස්තමේන්තු සකස් කර වෙනම ගොනුවක ගොනුකර ඇති බව තාක්ෂණ නිලධාරි දන්වා ඇත. |
| (ආ) | 2015 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන යටතේ ප්‍රදේශයේ පාසැල් ළමුන් වෙත බෙදාහැරීම සඳහා රු.197,036 ක් වටිනාකමැති වර්ග 05 ක පාසැල් පොත් 4847 ක් 2015 නොවැම්බර් 24 දින නාගරික මන්ත්‍රීවරයකු වෙත නිකුත් කර තිබුණද 2019 මාර්තු 07 දින සභාගත කර තිබූ ලිපියකට අනුව සඳහන්ව තිබුණේ ඔහුගේ අත්සන ව්‍යාජ ලෙස යොදා එය ලබා ගෙන ඇති බවත්ය. 2019 මැයි 31 දින වන විටත් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර නොතිබුණි. | විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිවයුත්තන් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ වනවිට පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මීගමුව බස් නැවතුම්පල ඉදිරිපිට මාර්ග රක්ෂිතයෙහි තාවකාලික පදනමින් සභාවට අයත් නොවන දේපලක ඉදිකරන ලද ගොඩනැගිලි වෙනත් පාර්ශවයන්ට බදුදීමට සභාව විසින් කටයුතු කර තිබුණි. | අයිතියතහවුරුකර ගැනීමකින්තොරව දේපල බදුදීමනොකළ යුතුවේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ඇ) | මීගමුව නගර මධ්‍යයේ මහජන බැංකුව ඉදිරිපිට හිස් බිම් තීරුවේ පවත්වාගෙන යන අනවසර කඩ 06 ක් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මහ නගර සභා ආඥා පනත අනුව ඉවත් කිරීමට පියවර ගත යුතුවේ. | පිළිතුරු ලබාදී නොමැත. |

3.3 මානව සම්පත් කළමනාකරණය
-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවකයන් 55 දෙනෙකුගෙන් 1986 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා අයවිය යුතු ආපදා හා දේපල ණය ශේෂය රු.487,226 ක්ද, උත්සව හා විශේෂ අත්තිකාරම් ණය ශේෂය රු. 76,692 ක්ද අදාල නිලධාරියාගෙන්, විශ්‍රාම වැටුපෙන් හෝ ඇපකරුගෙන් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබූ අතර අක්‍රීය ණය ශේෂයක් ලෙස ගිණුම්වල දිගින් දිගටම පවත්වාගෙන ගොස් තිබුණි. | අදාල පුද්ගලයාගෙන් හෝ ඇපකරුගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අක්‍රීය ණය ශේෂ කපාහැරීමට පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් පරිදි සභාවේ අනුමැතිය ලබාගෙන ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදුකර විගණනය වෙත වාර්තා කරමි. |

3.4 වත්කම් කළමනාකරණය
----------------------------

3.4.1 **වාහන උපයෝජනය**
**---------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාහන සමීක්ෂණයක් සිදුකර තිබුණද එම වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සමීක්ෂණ කරන ලද වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. | පිළිතුරු ලබාදී නොමැත. |

3.4.2 **වත්කම් භාවිතයට නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මීගමුව නව බස් නැවතුම්පලේ රු.5,122,994 ක් වැය කොට සවි කළ විද්‍යුත් පඩිපෙලේ නඩත්තු කටයුතු වෙනුවෙන් 2012 දෙසැම්බර් සිට 2017 වර්ෂය දක්වා රු.605,408 ක් ගෙවීම් කර තිබුණි.භාවිතයට ගෙන නොතිබීම නිසා විදුලි පඩිපෙලෙහි Stop rollers 2017 මැයි 31 දින සිට අක්‍රියවී පැවති අතර ඒ සඳහාරු.76,245 ක ඇස්තමේන්තුවක් අනුමත කර ගැනීම පමණක් කර තිබූ අතර එය ක්‍රියාත්මක තත්ත්වයකට පත් කර ගෙන නොතිබුණි. | වත්කම් භාවිතයට ගැනීම සිදු කළ යුතු අතර ගිවිසුම් ප්‍රකාර නඩත්තු කටයුතු ඉටුකරවා ගත යුතුවේ. | ඉදිරි අනාගතය පිළිබඳව සලකා විදුලි පඩිපෙල සකස්කර ඇති අතර ක්‍රියාත්මක තත්වයේ නොපැවතියද මාස තුනකට වරක් නඩත්තු කටයුතු සිදුකරනු ලැබේ. |

3.5 **ප්‍රසම්පාදනය**

**කොන්ත්‍රාත් පරිපාලනය**

| | | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) | | මීගමුව මහා නගර සහා පරිශ්‍රයේ වානිජ පහසුකම් වලින් යුත් දෙමහල් පුස්තකාල ගොඩනැගිල්ලක් රු.157,101,803 ක ඇස්තමේන්තුවක් යටතේ ඉදිකිරීම ආරම්භ කර තිබූ අතර 2018 දෙසැම්බර් 31 දින වන විට අතිරේක වැඩවල වටිනාකම රු.5,619,335 ක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ. | | |
| | (i) | ගොඩනැගිල්ලේ වහලය ඉදිකිරීමේදී එහි සැකිල්ලට යොදා ගත් ඇලුමිනියම් සඳහා පිළිගත් නිර්දේශයක් ඉදිරිපත් කර නොතිබූ අතරපුස්තකාල ඉදිකිරීමේදී භාවිතා කර තිබූ වානේ කම්බිවල ශක්තිමත් භාවය හා ඊට අදාල ගුණාංගයන් සම්බන්ධයෙන් ගොඩනැගිලි පර්යේෂණ ආයතන මගින් නියමිත පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදුකර තිබූ ඇතැම් ක්ෂේත්‍ර ඝණත්ව පරීක්ෂාවන් සඳහා කොන්ත්‍රාත්කරු විසින් අදාල ස්ථානය නිර්ණය කිරීම සිදුකර තිබූ අතර ඉදිකිරීම සඳහා යොදාගෙන තිබූ | ඉදිකිරීම් ද්‍රව්‍යවල ප්‍රමිතිය පිළිබඳව අතුරු පර්යේෂණයන් මගින් තහවුරු ලබා ගෙන ඉදිරිපත් කළ යුතුවේ. | උපදේශකආයතනයේ නිර්දේශ සහිත, කොන්ත්‍රාත් ආයතනය මගින් ඉදිරිපත් කරන ලද පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | ඇතැම් කොන්ක්‍රීට් මිශ්‍රණයන්ගේ සම්පීඩක ශක්තිය නියමිත ශක්ති මට්ටමේ නොතිබුණි. | | |
| (ii) | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලට අමතරව ගෙවීම් සඳහා බිල්පත් ඉදිරිපත් කර නොතිබියදී කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත ටයිල්, ඇලුමිනියම් හා වීදුරු මිලදී ගැනීමට වවුචර් 03 ක් මඟින් රු.9,723,914 ක් 2018 වර්ෂයේදී ගෙවා තිබූ අතර ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන ආයතනයේ(CIDA) ප්‍රසම්පාදන ලියවිලිවලට අනුව වැඩ බිමෙහි ඇති ද්‍රව්‍ය වටිනාකමින් උපරිමව ගෙවිය හැකි මුදල සියයට 80 දක්වා වුවත් සියයට 100 ක්ම ගෙවා තිබුණි. | ප්‍රසම්පාදන ලියවිලිවල ඇති කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ගෙවීම්,කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කරන බිල්පත්වලින් අඩුකර ඇත. |
| (iii) | 2016 මාර්තු 16 දින සිට වර්ෂයකින් මෙම ගොඩනැගිල්ල නිම කළ යුතු වුවද 2018 මැයි 31 දින වන විටත් කොන්ක්‍රීට් යෙදීම, සිවිලින් ගැසීම, ටයිල් ඇල්ලීම හා විදුලි උපාංග සවි කිරීමේ කටයුතු අවසන්වී නොතිබූ අතර ඒ අනුව මුළු ඇස්තමේන්තු මුදල වූ රු.157,101,803 කින් 2019 මැයි 30 දින වන විට රු.53,576,550 ක් ගෙවා අතරමඟ නවතා තිබුණි. | ගිවිසුම්ගත කාලය තුළ ඉදිකිරීම් කටයුතු නිම කළ යුතු අතර ප්‍රමාදයන් සඳහා ගාස්තු අයකළ යුතුවේ. | නියමිත කාලය තුල ව්‍යාපෘතිය නිම නොකල නිසා CIDA ආයතනයේ උපදෙස් ප්‍රකාරව ගිවිසුම අවසන් කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | දළුවකොටුව ජනපද මාවතේ II වන පටුමඟ කාපට් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කර තිබූ කාර්යයන් නිම කිරීමේදී අයිතම 04 ක් ඇස්තමේන්තු කල ප්‍රමාණයට වඩා අඩුවෙන් නිම කිරීම නිසා රු.1,264,261 ක විචලනයක් දක්නට ලැබූ අතර විචලනය සියයට 41-55 ත් අතර විය. | ඇස්තමේන්තු වඩා තාත්වික ආකාරයට සකස් විය යුතුවේ. | ප්‍රතිපාදිත මුදලට ඇස්තමේන්තු සකස් කළ නමුත් සත්‍ය වශයෙන් ඉටු කළ ප්‍රමාණය මත ගෙවන ලදී. |
| (ඇ) | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම - 2017 වැඩ සටහන යටතේ සේරම් ගොඩනැගිල්ල අසල මාර්ගය කාපට් කිරීම සඳහා රු1,813,933 (වැට් රහිත) ක් ඇස්තමේන්තු කර තිබුණු අතර රු.1,365,156 ක් ගෙවීම් කර තිබුණි. අයිතම අංක 07 යටතේ138.68 $m^3$ ක ප්‍රමාණයට ABC සපයා, අතුරා තැලීමසිදුකිරීම සඳහා රු.352,629ක් ඇස්තමේන්තු කර තිබුණද එකී කාර්ය කොන්ත්‍රාත්කරු විසින් සිදුකර නොතිබුණි. | ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී සිදුවන ප්‍රවණතාවයන් පිළිබඳව තාක්ෂණ නිලධාරින් අවබෝධයෙන් කටයුතු කළ යුතුවේ. | එම වැඩ අයිතමය මගින් මාර්ගය තව දුරටත් ඉස්සීමෙන් නිවාස ගංවතුරෙන් යටවීමේ ප්‍රවණතාවයක් පවතින හෙයින් ඉටු නොකලෙමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ---------------------------- | --------------- | ------------------------------ |
| ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ රු.53,751,201 ක් වූ ව්‍යාපෘති 44 කින් ව්‍යාපෘති 08 ක ප්‍රතිපාදිත මුදල හා සත්‍ය වියදම අතර පරතරය සියයට 52 සිට සියයට70 දක්වා වූ හෙයින් නිවැරදි ඇස්තමේන්තුවකින් තොරව ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණි. | නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | ඇස්තමේන්තු මුදලට වඩා අඩු අගයකට ගිවිසුම්ගතවී ඇති බැවින් විචලනයක් පවතී. |